මෙල්බන් නාට්‍ය ක්ෂෙත්‍රයේ බොහෝ හපන් කම් පෑ ගාමිණී රණසිංහ සිය ප්‍රථම කෙටි නාට්‍ය ත්‍රිත්වය ත්‍රිවිධ නමින් කරළියට ගෙනෙන්නට කටයුතු යොදමින් සිටියි. මෙය මෙල්බන් නාට්‍ය ඉතිහාසයේ වැදගත් කඩඉමක් යි සන්නසේ අපි සිතමු. ගාමිණී සමගින් මේ සම්බන්ධයෙන් කතා බහ කරන්නට අප සිතුවේ එනිසා ය. පහත දැක්වෙන්නේ අප ගාමිණී රණසිංහ කලාකරුවා සමග කළ කතා බහක සටහනකි.

ඇයි මේ කෙටි නාට්‍ය උළෙල ත්‍රිවිධ නමින් නම් කළේ?

මා මෙයට පෙර කරන ලද නාට්‍ය ත්‍රිත්වයක එකතුව නිසා මම මෙයට ත්‍රිවිධ යන නම තැබුවා. එසේ මිස වෙනත් විශේෂ කාරණයක් නැහැ. මෙම කෙටි නාට්‍ය උළෙලට කොන්ත්‍රාත්තුව වරම අපායේ අධිපති යන නාට්‍ය මේ උළෙලට අයත් වෙනවා. මේවා කලින් කල පෙන්වා තිබෙනවා. මෙම නාට්‍ය වලට විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලැබුණා. නමුත්මෙය නරඹන්නට හැකි වුණේ සීමිත පිරිසකට පමණයි. ඉතින් මම හිතුවා මුලින් පෙන් වූ නාට්‍ය වල යම් යම් වෙනස් කම් සහිතව නව නිර්මාණ ලෙස ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කරන්න.

ඇයි ඔබ කෙටි නාට්‍ය පමණක් නිෂ්පාදනයට යොමු වෙලා තියෙන්නෙ?

එහෙම විශේෂයක් නෑ. නමුත් කෙටි නාට්‍ය නිෂ්පාදනයට මා පෙළඹුණේ අහම්බෙන් කිව්වොත් නිවැරදියි. එයට මා මුලින්ම ස්තුතිවන්ත වෙන්නෙ ජර්මාණු කාර්මික අභ්‍යාස විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමයට. ගිම්හාන රංගන ප්‍රසංගයට කෙටි නාට්‍යයක් කරන්නැයි මට ආරාධනා ලැබුණා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි මම කෙටි නාට්‍ය නිෂ්පාදනයට පෙළඹුණේ.

කෙටි නාට්‍යයයි දීර්ඝ නාට්‍යයයි අතර ලොකු වෙනසක් තියෙනවා නේද?

ඔව් පැහැදිලි වෙනසක් තියෙනවා. මූලිකාංග එක වුණත් කෙටි කාලයකින් සියලුම නාට්‍ය ගුණාංග සහිතව නාට්‍යයක් ඉදිරිපත් කිරීම ලේසි පහසු කාර්යයනක් නෙවෙයි. මා මේ කාර්යයට අත ගහන්නට පෙර ලෝක ප්‍රකට කෙටි නාට්‍ය ශිල්පීන්ගේ කෙටි නාට්‍ය ඇතුළත් පොත් පත් හුගාක් කියෙව්වා. ඒ ගැන අධ්‍යයනය කළා. ඒ එක්කම කෙටි නාට්‍ය කියන්නේ කාලයෙන් අඩු ඒවා නෙවෙයි. අන්තර්ගතය වශයෙන් ආකෘතිමය වශයෙන් වෙනස් කම් රැසක් තියෙනවා. මෙම නාට්‍ය නැරඹීමෙන් ඒ ගැන ඔබ යම් අත්දැකීමක් ලබාගන්න හැකිවේවි.

ඇයි මේ විශේෂණ පදයක් යොදලා තියෙන්නෙ "අපි අපටම හිනාවෙමු" කියලා?

හුගාක් පුද්ගලයන් අනිත් අයගේ දුර්වලකම්

දැකලා ඒවට හිනා වෙන්න හරිම කැමතියි. නමුත් ඒ හිනාවෙන හැම කෙනාම ළඟත් ඒ දුර්වලකම් තිබෙන බව කාටවත් තේරෙන්නෙ නැහැ. අපි හැමෝම ළඟ වයිරය ක්‍රෝධය ඊර්ෂ්‍යාව මාන්නය මේ සියලු දේම අඩු වැඩි වශයෙන් තියෙනවා. මම උත්සාහ කරන්නෙ උපහාසයත් සමගින් තමන් ළඟත් මෙවැනි දේ තියෙන බව මතක් කර දෙන්න. ඒකයි මම මෙම නාට්‍ය උළෙලට "අපි අපටම හිනාවෙමු" කියන පාඨය යෙදුවේ.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෙ මේ අයුරින් මා සඳහන් කළාට මේ නාට්‍ය වල කාටවත් අපහාස උපහාස නැහැ.

ඔබ මේ කෙටි නාට්‍ය තුල ම රැඳෙන්නද කල්පනා කරන්නෙ?

හොඳ ප්‍රශ්නයක්. මම මුලින්ම කිව්වනෙ කෙටි නාට්‍ය කරන්න මම පෙළඹුණේ අහම්බෙන් කියලා. හුගාක් අයට දීර්ඝ නාට්‍යයක් බලන්න කාලවේලාවක් නැහැ. කුඩා දුවා දරුවන් එක්කත් අමාරුයි. කෙටි කාලයක් තුළ නාට්‍යයක පූර්ණ චින්තනය කෙටි නාට්‍යයක් තුලින් ලබා දෙන්න පුලුවන්. නමුත් මගේ මීළඟ බලාපොරොත්තුව දීර්ඝ නාට්‍යයක් කරන්න තමයි. නමුත් එය අද හෙට ලබන මාසෙ සිදුවන දෙයක් නෙවෙයි. අනාගතේදි සිදුවෙයි.

ඔබේ මේ කාර්යයට ඔබේ හිතවතුන්ගේ සහයෝගය කොහොම ද?

මට ඒ අයට ස්තුති කරන්න වචන නෑ. හැම කෙනෙක්ම මට මචනයෙන් හරි උදව් උපකාර කරනවා. ඒක අපි වගේ පොඩි වැඩ කරන්න උත්සාහ කරන අයට ලොකු ධෛර්යයක්. අනිත් ඒක තමයි මා වටා සිටින අපේ රංග ශිල්පීන්. ඔවුන් විශාල කැපවීමක් මේ සඳහා යොදනවා. සමහර වෙලාවට මාව ඇදගෙන යන්නෙත් අපේ නලු නිළි පිරිසයි. මෙයට සම්බන්ධ වෙලා ඉන්න හුගක් අය නාට්‍ය ක්ෂෙත්‍රයේ යම් යම් අත්දැකීම් තියෙන අය. සමහර අය හැංගිලා හිටපු අය. ඔවුන්ගේ දක්ෂකම් ඉදිරියට දෙන්න උත්සාහ නොකරපු අය. මේ සියලු දෙනාගේම දක්ෂකම් ත්‍රිවිධ නාට්‍ය උළෙලේදී ඔබට දැක ගන්නට හැකිවේවි. අතීතයේදි වගේ නෙවෙයි දැන් විවිධ නාට්‍ය නිෂ්පාදනය වෙනවා.

උදාහරණයක් හැටියට පසුගිය කාලයේ නුනුවටයේ කතාව දුවිලි මහාසාර කැළණි පාලම වැනි නාට්‍ය අපේ නලු නිළියන් සමග ඉතා සාර්ථකව ඉදිරිපත් කළා. ඒ එක්කම මේ වකවානුව වෙනවිට ලංකාවේ දක්ෂ නලු නිළියෝ විශාල පිරිසක් මෙරටට පැමිණ සිටිනවා. ඉතින් මේ අයත් අනාගතයේ නාට්‍යයක් කරනවා නම් මේ නලු නිළියන් ගෙන් ප්‍රයෝජන ගන්න පුලුවන්.

ගාමිණී රණසිංහගේ ත්‍රිවිධ නාට්‍ය ත්‍රිත්වයට රංගනයෙන් අජිත් ද සිල්වා ධර්මසිරි ජයසිංහ උපුල් නයනානන්ද ලලිත් චූලරත්න කුලසිරි දීපානන්ද ලීලානන්ද ගලප්පත්ති ලක්ෂ්මන් ගමගේ නෙලුම් අමුනුගම නිෂාමලි වේරගොඩ ගයනි මීමනගේ රත්නා ගුණසිංහ හරින්ද්‍රා ජයසිංහ ලක්ෂ්මික් ජයසිංහ දිළිණි වල්පොල දිනේෂ් ජයකොඩි රෝහණ අමරසිරි ජෙයරාජ් හේවාගමගේ දායක වෙති. මෙහි තේමා ගීතය ලක්ෂ්මන් ගමගේ රචනා කර යශෝධරා සරච්චන්ද්‍ර තනු නිර්මාණය කර ඇත . සංගීතවත් කරන්නේ රොහාන් නෙත්සිංහ ය.

ත්‍රිවිධ කෙටි නාට්‍ය උළෙලේ තිබෙන නාට්‍ය ජනතා සම්මානයට පාත්‍ර වූ නාට්‍ය වෙයි. මෙම නාට්‍ය බොහෝ දෙනෙකුට නැරඹීමට ඉඩක් නොලැබුණ බව අපේ හැඟීමයි. 2007 ඔක්තෝබර් 6 වන දා සවස 3 ට සහ 6.30ට කෙල් වොරිසන් රංග ශාලාවට ඔබ පිය මැන්නොත් මෙහි ඇති අපූර්වත්වය විඳගන්නට හැකි වනු නොඅනුමානයි. අපි අපිටම හිනාවෙන්න හොඳ අවස්ථාවක් වේවි.

සංවාද සටහන ශ්‍රීනාත් මද්දුමගේ